(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(6).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2016 ඔක්තෝබර් මස 17 වැනි සඳුදා**

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 187/'16

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු ලකී ජයවර්ධන මහතා

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු චන්දිම ගමගේ මහතා

ගරු මොහොමඩ් නවවි මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු ධර්මලිංගම් සිද්ධාර්ථන් මහතා

ගරු ලසන්ත අලගියවන්න මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා,— තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය පිළිබඳ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් එහි අංක A/RES/70/1 දරන යෝජනා සම්මතය මඟින් අපේක්ෂා සහගත තිරසර සංවර්ධන අරමුණු (SDGs) දහ හතක් ඇතුළත් තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය දියත් කර ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයෙහි ආණ්ඩුව ද මෙම යෝජනා සම්මතය අනුමත කර එකී න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම සඳහා නිති උනන්දුවෙන් යුතුව කටයුතු කිරීමට කැපවී සිටින හෙයින් ද;

තිරසර සංවර්ධන අරමුණු, තිරසර සංවර්ධනයෙහි ආර්ථික, සමාජයීය සහ පාරිසරික මානයන් සංයෝජනය කෙරෙන අන්තර් බැඳීම් සහිත රාමුවකින් යුක්ත වන හෙයින් ද;

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී පාර්ලිමේන්තු ඒවායෙහි නීති සම්පාදන, අයවැය සකස්කිරීමේ සහ අධීක්ෂණ කාර්යයන් හරහා ප්‍රමුඛස්ථානය ගෙන සිටින හෙයින් ද;

තිරසර සංවර්ධනය සඳහා වන එක්සත් ජාතීන්ගේ 2030 න්‍යාය පත්‍රය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීමේ කාර්යය ඉෂ්ට කෙරෙන බව සහතික කර ගැනීම සඳහා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කර සිටියි:—

(අ) අදාළ රේඛීය අමාත්‍යාංශ විමසා ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සහ නීති සම්පාදනය;

(ආ) ප්‍රමාණවත් පරිදි දේශීය සම්පත් වෙන් කර දීම සහ ජාත්‍යන්තර අරමුදල් සපයාගැනීමේ ක්‍රම සොයාගැනීම;

(ඇ) ක්‍රියාත්මක කිරීමේ රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය;

(ඈ) ජාතික, පළාත් සභා සහ පළාත් පාලන මට්ටම්වලදී ජාලගතකරණ ක්‍රියාමාර්ග;

(ඉ) රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය දිරිමත් කිරීම;

(ඊ) එක්සත් ජාතීන්ගේ නියෝජිතායතනවල සහ සිවිල් සමාජ සංවිධානවල සහාය ලබා ගැනීම;

(උ) කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමෙන් රටවල් අතර ප්‍රවීණතාවය සහ අත්දැකීම් හුවමාරු කර ගැනීම;

(ඌ) වෙනම දත්ත පදනමක් සකස් කිරීම සහ කාලීන වශයෙන් ප්‍රගතිය සමාලෝචනය කිරීම; සහ

(එ) ඉහත සඳහන් කරුණු හා සම්බන්ධ හෝ එම කරුණුවලට ආනුෂංගික සියලු කාරණා පිළිබඳ සළකා බැලීම.

2. (අ) එකී කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකවරයා විසින් පත්කළ යුතුය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයන් පහළොස් දෙනෙකුට (15) නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. එකී කාරක සභාවට,

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කර ඇති කරුණු පූර්ණ වශයෙන් සලකා බැලීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම පුද්ගලයෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා දීමට හෝ ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවට සහාය වීම පිණිස අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වාගෙන යාමට ද,

බලය තිබිය යුතුය.

4. සිය පළමු රැස්වීම් දිනයේ සිට එක් වසරක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් ලබාදෙන අන් කවර හෝ අමතර කාලසීමාවක් තුළ හෝ කාරක සභාව විසින් සිය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.